**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**
**නීති වේදී උපාධි පාඨමාලාව - 4 වන මට්ටම**
**අවසාන පරීක්ෂණය - 2020/2021 (විවෘත ග්‍රන්ථ පරීක්ෂණය)**
**LLU4707/LWU2313 - පවුල් නීතිය**
**කාලය - පැය (03) තුනයි**

---

**දිනය: 2021 සැප්තැම්බර් 03** **වේලාව: පෙ.ව. 9.30 - ප.ව.12.30**

---

**අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

**මුළු ප්‍රශ්න ගණන 06 යි.**

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.**

**ඔබ විසින් තෝරා ගනු ලබන ප්‍රශ්නවලට අදාළ පිළිතුරු විනිශ්චිත නඩු තීරණ හා ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ඇසුරින් ඉදිරිපත් කළ යුතුය.**

**1.** සිවකුමාර් සහ දේවානි 2012 වසරේ දී ඔවුන්ගේ විවාහය සාමාන්‍ය නීතිය යටතේ ලියාපදිංචි කළහ. විවාහයෙන් වසර ගණනාවකට පසුවද ඔවුන්ට දරුවන් නොලැබුණ බැවින් දරුවකු දරුකමට හදා ගැනීම සඳහා සිවකුමාර් යෝජනා කළේය. කෙසේ වෙතත් දේවානි එයට අකැමැති විය. එසේ නමුත් සිවකුමාර් ඔහුට දරුවකු හදා ගැනීමට අවශ්‍ය බව යාපනයේ සිටින ඔහුගේ මිතුරෙකු වන ගෝකුලන්ට පැවසුවේය. පසුව ගෝකුලන් වයස අවුරුදු 11 ක් වන විරාන් නම් පිරිමි දරුවකු ඔහුගේ ගමේ ජීවත් වන බවත් ඔහුව දරුකමට හදාගත හැකි බවත් සිවකුමාර්ට පැවසුවේය. විරාන්ගේ දෙමාපියන්ට දරුවන් හයක් සිටින නමුත් ඔවුන්ව නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් ආදායමක් නොමැත. සිවකුමාර්, ගෝකුලන් හමු වීමට යාපනයට ගොස් ඔහුත් සමඟ විරාන්ගේ නිවස ගියහ. ඔවුන් විරාන්ව දරුකමට හදා ගැනීමට විරාන්ගේ දෙමාපියන්ගෙන් අවසර ඉල්ලීය. සිවකුමාර් සහ ඔහුගේ පවුල සමඟ විරාන්ට යහපත් ජීවිතයක් ගත කළ හැකි බව සිතමින් විරාන්ගේ දෙමාපියන් එම ඉල්ලීමට එකඟ වූහ.

**(i)** සිවකුමාර් ට, විරාන්ව නීත්‍යානුකූලව දරුකමට හදා ගැනීමේ හැකියාවක් පවතින්නේද යන්න සාකච්ඡා කරන්න. **(ලකුණු 15)**

**(ii)** සිවකුමාර් සහ දේවානි කැනඩාවේ ජීවත් වන විදේශික යුවලක් යැයි උපකල්පනය කරන්න. ඔවුන්ට ශ්‍රී ලංකාවේ පවත්නා නීතිය යටතේ විරාන්ව දරුකමට හදා ගත හැකිදැයි සාකච්ඡා කරන්න. **(ලකුණු 10)**

**2.** පහත රූප සටහන භාවිත කරමින් ශ්‍රී ලංකාවේ නඩත්තු බැඳීම් සඳහා අදාළ නීතිය පිළිබඳ සාකච්ඡා කරන්න




**(ලකුණු 25)**

**3.** *" විවාහය පවතින අතරතුරදී බාලවයස්කාර දරුවන්ගේ භාරකාරත්වය සම්බන්ධයෙන් පියාට වරණීය අයිතියක් ඇත්තේය යන සාම්ප්‍රදායික රෝම ලන්දේසි නීති සංකල්පය අවසානාත්මක හෝ නීතියේ පාලනයෙන් බැහැර සංකල්පයක් නොවන බවත් දරුවාගේ ශරීරයට, සෞඛ්‍යයට හා සදාචාරයට හානිකර වීම වැනි සුවිශේෂ අවස්ථාවන්හිදී එම සංකල්පය සම්බන්ධයෙන් මැදිහත්වීමට අධිකරණයට බලය ඇත."*

*ජෙයරාජන් එ. ජෙයරාජන් (1999) 1 Sri L.R. 113*

දරුවන්ගේ භාරකාරත්වය සම්බන්ධයෙන් පියා සතු වරණීය අයිතිය සහ දරුවාගේ උපරිම යහපත ඇසුරෙන් ඉහත නෛතික මතය සාකච්ඡා කරන්න.

**(ලකුණු 25)**

**4.** රාණි සහ සමන්ත 2010 වසරේදී විවාහ වූහ. විවාහයෙන් පසු ඔවුන් සමන්තගේ දෙමාපියන්ගේ නිවසේ ජීවත් වූහ. සමන්ත, රාණි බලාපොරොත්තු වූ ආකාරයේ පුද්ගලයෙකු නොවන බව කාලයක් ගත වන විට ඇය වටහා ගත්තාය. සමන්තගේ දෙමාපියන් රාණිගෙන් දෑවැද්ද පිළිබඳ නිතරම ප්‍රශ්න කිරීම, සමන්ත මත්පැන් පානයට ඇබ්බැහි වී සිටීම, සමන්ත නිතරම රාණි සමඟ රණ්ඩු ඇති කර ගැනීම වැනි හේතු නිසා රාණිට සිය විවාහ ජීවිතය කටුක අත්දැකීමක් විය. මේ අතර සමන්ත එම ගමේම නිමාලි නම් කාන්තාවක් සමඟද රහසිගත සබඳතාවක් පවත්වන බවටද කටකතා පැතිර ගිය අතර රාණි ඒ පිළිබඳ සමන්තගෙන් විමසීය. ඒ සම්බන්ධයෙන් කිසිදු පිළිතුරක් නොදුන් සමන්ත, තවදුරටත් ඔහු සමඟ මෙම නිවසේ ජීවත් වීමට නොහැකි නම් ඇය නිවසින් පිටව යා යුතු බව පවසමින් බැන වැදීය. කෙසේ වෙතත් ඔවුන්ට දරුවකු ලැබුණහොත් පවුල් ජීවිතය යහපත් වේ යැයි සිතමින් රාණි ඉවසීමෙන් ඇයගේ යුතුකම් ඉටු කළාය. පසුව සමන්ත සහ නිමාලි අතර පවතින සබඳතාව ගැන කටකතා සත්‍ය බවත් එම සබඳතාවය විවාහයට පෙර සිටම පවතින එකක් බවත් රාණි අනාවරණය කර ගත්තාය. අනතුරුව රාණි ඇයගේ දෙමාපියන්ගේ නිවසට ගිය අතර ඉන්පසු සමන්ත ඇය ගැන කිසිදු සොයා බැලීමක් නොකළේය.

**(i)** රාණිට සිය විවාහය අවසන් කිරීමට අවශ්‍යව ඇත. රාණිට ඇයගේ නඩුව සාර්ථක කර ගැනීමට හැකිද? සාකච්ඡා කරන්න. **(ලකුණු 15)**

**(ii)** වෛවාහක නිවස හැරයාමෙන් මාස 7 කට පසු රාණි දරුවකු ප්‍රසූත කළ බව උපකල්පනය කරන්න. සමන්ත දරුවාගේ පිතෘත්වය ප්‍රතික්ෂේප කරයි. දරුවාගේ පිතෘත්වය තහවුරු කිරීමට රාණිට පවතින හැකියාව පිළිබඳ නෛතික තත්වය සාකච්ඡා කරන්න. **(ලකුණු 10)**

**5.** ඔබ, විවාහ කටයුතු සඳහා අදාළ වන නීති අතර විෂමතා සෙවීමට සහ විවාහ කටයුතු සම්බන්ධයෙන් එක් නීතියක් සකස් කිරීම සඳහා පත් කර ඇති කමිටුවක සාමාජිකයකු යැයි උපකල්පනය කරන්න. පහත කරුණු වලට අදාළව ප්‍රශ්න සහ විෂමතා ආමන්ත්‍රණය කරමින් වාර්තාවක් සකස් කරන්න.

- වලංගු විවාහයක් සඳහා වන අවශ්‍යතා
- විවාහය විසුරුවා හැරීම

**(ලකුණු 25)**

**6.** පහත වගුවේ දී ඇති විශේෂ මාතෘකා ආවරණය කරමින් ශ්‍රී ලංකාවේ ළමුන්ගේ අයිතිවාසිකම් විවේචනාත්මකව තක්සේරු කරමින් වාර්තාවක් සකස් කරන්න. “A” තීරයේ සඳහන් කර ඇති පුළුල් අංශ ද්විත්වය “B” තීරයේ සඳහන් කර ඇති  කොටස් ත්‍රිත්වය යටතේ ආවරණය කරමින් ඔබේ තක්සේරු කිරීම කළ යුතුය.

| A | B |
|---|---|
| • අධ්‍යාපනයට ඇති අයිතිය<br>• ලිංගික හිංසනය | • ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත නීතිය<br>• අධිකරණමය මැදිහත්වීම්<br>• අන්තර්ජාතික නීතිය |

**(ලකුණු 25)**

***** හිමිකම් ඇවිරිණි *****